ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025.02.13

එස්.තේජන සම්පත් සමරසිංහ මයා
අරුණ ඉලෙක්ට්‍රිකල්ස්
කඩවීදිය
දඹුල්ල පාර
හබරණ

පැමිණිලිකරු

01. එන්.පී.එස්.ජයලත් මයා
ප්‍රධාන පොලිස් පරික්ෂක
පොලිස් ස්ථානය
හබරණ

02. ජී.ජී.සී.ජයතිස්ස මයා
උප පොලිස් පරික්ෂක
පොලිස් ස්ථානය
හබරණ

03. ජේ.ආර්.ගාමිණී සමරසිංහ මයා
පොලිස් සැරයන් 63577
උප පොලිස් පරික්ෂක ( වර්තමාන )
පොලිස් ස්ථානය
හබරණ

04. පොලිස් සැරයන් 66505 ප්‍රසාද් මයා
පොලිස් ස්ථානය
හබරණ
( දැනට වැඩ තහනමකට ලක්ව ඇත. )

05. පොලිස් සැරයන් 7355 සුනිල් මයා
පොලිස් ස්ථානය
හබරණ


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

06. ඩී.සී.දර්ශන බුද්ධික චන්දන මයා
පොලිස් කොස්තාපල් රියදුරු 75552
පොලිස් ස්ථානය
හබරණ

07. පොලිස් කොස්තාපල් 68214 සම්පත් මයා
පොලිස් ස්ථානය
හබරණ

08. ජේ.එම්.කපිල දිසානායක මයා
පොලිස් කොස්තාපල් 95535
පොලිස් ස්ථානය
හබරණ

09. බී.එම්.අයි.දේශප්‍රිය මයා
පොලිස් කොස්තාපල් රියදුරු 18081
පොලිස් ස්ථානය
හබරණ

10. පොලිස් කොස්තාපල් රියදුරු 89740 කුමාර මයා
පොලිස් ස්ථානය
හබරණ

වගඋත්තරකරුවන්

<u>පැමිණිලි අංකය : **HRC/ANU/145/2022(I)**</u>

<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, 2022.03.18 වන දින සවස හබරණ පොලිස් ස්ථානයේ රථවාහන අංශයේ සේවයේ නියුතු ප්‍රසාද් යන පොලිස් නිලධාරියා තම කඩය ඉදිරිපිට ඔහුගේ යතුරු පැදිය නවත්වා "කෑ නොගහ හිටපන්, වැඩිය කෑ ගැහුවොත් වෙන දේ බලාගනින්" යනුවෙන් පවසා යන්න ගිය බවයි. තමා එම තර්ජනය පිළිබඳව වැඩි තැකීමක් නොකර තමාගේ කඩයට ආ පුද්ගලයෙකු හට සේවය ලබාදීම දිගටම කරමින් සිටින අතරේ පැය භාගයකට පමණ පසු තර්ජනය කර ගිය පොලිස් නිලධාරියා හා තවත් පොලිස් නිලධාරීන් 15-20ක් පමණ පැමිණ තම කඩයේ දොර බලහත්කාරයෙන් විවෘත කරගෙන ඇතුලට පැමිණ තමාට පහර කිහිපයක් ගසමින් බලෙන් රැගෙන යාමට උත්සාහ දරන ලද බවත්, එම අවස්ථාවේදී හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් "ඕකව ඇදලා ගනිල්ලා" සහ "දාගනින් ජීප් එකට" කියා පවසා සිටි බවත්, එවිට තම බිරිඳ තමාව රැගෙන යාම වළක්වමින් පහර දෙන්නේ කුමකටද යන්නත් රැගෙන යන්නේ

කුමකටද යන්නත් විමසූ බවත්, එවිට බිරිඳගේ ජංගම දුරකථනය උදුරාගෙන බිරිඳට ද පහරදීමක් සිදුකරන ලද බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එමෙන්ම, තමාව බිම දිගේ ඇදගෙන ගොස් ජීප් රථයට දමා පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, පොලිස් ස්ථානයේදී තමාට පහරදී පරුෂ වචනයෙන් බැන වදින ලද බවත්, තමාව අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කරන තෙක්ම තමාට වතුර හෝ නිවසින් ගෙන ආ ආහාරවත් ලබාදීමට කටයුතු නොකළ බවත්, තමාගෙන් කටඋත්තරයක් හෝ නොගත් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, තමා අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා පොලිස් ස්ථානයේ සිට හබරණ හන්දිය තෙක් පා ගමනින් මාංචු දමා රැගෙන ආ බවත්, හන්දියේ නවතා තිබූ ජීප් රථයට නංවා ගත් බවත්, එම අවස්ථාවේදී හබරණ නගරයේ සිටි ජනතාවට තමාව නිරාවරණය වූ බවත් ය. මෙම සිදුවීම පොලිස් ස්ථානාධිපතිවරයා විසින් තමාව ලජ්ජාවට පත් කිරීම සඳහා කරන ලද්දක් වන බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත. පොලිස් නිලධාරීන් විසින් තමාට සිදුකරන ලද මෙකී අසාධාරණයට සාධාරණය ඉටුකර දෙන මෙන් පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කරමින් ඉල්ලා සිටියි.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අංක OIC/HB/OW/1817/2022 සහ 2022.04.17 දිනැති වාර්තාවක් 1 වන වගඋත්තරකරු වන හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කොට ඇත්තේ, මෙම පැමිණිලිකරුට විරුද්ධව 2022.03.18 වන දින 118 හා 119 දුරකථන මධ්‍යස්ථාන මගින් පැමිණිලි 02ක් ලැබී තිබුණු බවයි. මෙම පැමිණිලි අනුව 2022.03.18 වන දින පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බවත්, මෙම පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කළද, ඔහු ප්‍රකාශයක් ලබාදීම ප්‍රතික්ෂේප කරන ලද බවත්, මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා ලද්දේ ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 344 වගන්තිය සහ 1979 අංක 41 දරණ බීමත්ව කරන වැරදි විධිවිධාන පනතේ 02 වගන්තිය හා එකී පනතේ 12(2) වගන්තිය අනුව වන බවත් එකී වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, පැමිණිලිකරු 2022.03.18 වන දින පැය 19.25ට අත්අඩංගුවට ගෙන 2022.03.19 දින පැය 10.10ට අධිකරණය වෙත රැගෙන ගිය බවත්, මෙම පැමිණිලිකරුට එරෙහිව අංක බී 392/22 යටතේ කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කරන ලද බවත්, අත්අඩංගුවට ගත් පැමිණිලිකරුව හබරණ රෝහලේ වෛද්‍ය නිලධාරී වෙත අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම අංක 311/22 යටතේ ඉදිරිපත් කරන ලද බවත් එකී වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක පී.ජී.සී.ජයතිස්ස නිලධාරියා විසින් ප්‍රකාශ කර සිටින්නේ, 2022.03.18 වන දින තමා ගල්ඔය පොලිස් මුරපොලේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ බවත්, මෙදින හබරණ පොලිස් ස්ථානයේ රාජකාරී කටයුතු සඳහා කැඳවා තිබුණු බවත් ය. 2022.03.19 වන දින මෙම පැමිණිලිකරුව කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන යාම සඳහා තමාට රාජකාරී පවරා තිබූ බවත්, ඒ අනුව එදින මෙම පැමිණිලිකරුව කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. 2022.03.19 වන දින පැමිණිලිකරුව අධිකරණය වෙත රැගෙන යාම සඳහා පොලිස් ස්ථානයේ වාහනයක් තිබේදැයි සොයා බැලූ බවත්, වාහනයක් පොලිස් ස්ථානය තුළ නොතිබූ බවත්, පොලිස් ස්ථානය සතුව තිබූ කැබ් රථය 10 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් රියදුරු 89740 කුමාර විසින් ටයර්වල පවතින දෝෂ සහිත තත්වයක් හේතුවෙන් ටයර් කඩය වෙත රැගෙන ගොස් තිබූ බවත්, ඔහු සමග දුරකථනයෙන් කතා කර වාහනය පොලිස් ස්ථානය වෙත කැඳවා ගත හැකිද යන්න විමසූ බවත්, ඔහුට වාහනය නැවත පොලිස් ස්ථානය වෙත රැගෙන ආ හැකි වේලාව නිශ්චිතව ප්‍රකාශ කිරීමට නොහැකි බව පැවසූ බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන යා යුතු නමුත්, වාහනයක් නොමැති නිසා පැය 10.10ට පිටවීමේ සටහන් යොදා 5 වන වගඋත්තරතරු වන පොලිස් සැරයන් 7355 සුනිල් නිලධාරියා සමඟ මෙම පැමිණිලිකරු සහ තවත් සැකකරුවෙකු රැගෙන යාමට කටයුතු කළ බවත්, පොලිස් ස්ථානය විසින් සැකකරුවන් රැගෙන යාම සඳහා වාහනයක් සපයා නොදුන් බැවින් සාමාන්‍ය ක්‍රමවේදය අනුව වාහන නොමැති අවස්ථාවලදී සැකකරුවන් පොදු ප්‍රවාහන සේවයේ රැගෙන යන බැවින් මෙම සැකකරුවන් දෙදෙනා පොදු ප්‍රවාහන සේවයේ රැගෙන යාම සඳහා එළියට රැගෙන ආ බවත්, වන සංරක්ෂණ කාර්යාලය ඉදිරිපිටදී පොලිස් ස්ථානයේ කැබ් රථය දඹුල්ල පාරේ පැමිණෙනු දුටු බවත්, ඒ අනුව අදාල වාහනය ස්ථානය වෙත ගෙන්වා ගෙන එම වාහනයෙන් අධිකරණය වෙත රැගෙන ගිය බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. පැමිණිලිකරුට අවමන් සහගත සැළකිල්ලක් වන ආකාරයට තමා කටයුතු නොකළ බවත්, එම අවස්ථාවේ මෙම පැමිණිලිකරු අධිකරණය වෙත රැගෙන යා යුතු බැවිනුත්, මොහුව රැගෙන යාම සඳහා වාහන නොතිබූ බැවිනුත්, මොහවු රැගෙන යා හැක්කේ පොදු ප්‍රවාහන සේවයේ වන බැවිනුත් පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙන ඒමට සිදු වූ බව 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

3 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 63577 ජේ.ආර්.ගාමිණී (වර්තමානයේ උප පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා සිටී) ප්‍රකාශ කර සිටින්නේ, 2023.03.18 වන දින පැමිණිලිකරුගේ නිවස ඉදිරිපිට බීමත් අයෙකු කෑ ගසන බවට තමාට දුරකථන ක්‍රියාකරු විසින් තම දුරකථනයට ඇමතුමක් ගෙන දන්වා සිටින ලද බවයි. ඒ අනුව තමා එම ස්ථානය වෙත 8 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 95535 කපිල නිලධාරියා සමග ගිය බවත්, තමා එම ස්ථානයට යන විට පොලිස් කැබ් රථය තිබූ බවත්, තවත් පොලිස් නිලධාරින්ද එතන සිටිය බවත්, තමා මෙදින රථවාහන

රාජකාරිවල යෙදී සිටින ලද බැවින් මෙම ප්‍රදේශයේ මාර්ගය පැහැදිලි කිරීම සඳහා කටයුතු කරන ලද බවත්, පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ නොවූ බවත් ප්‍රකාශ කර ඇත.

8 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 95535 කපිල දිසානායක නිලධාරියා ප්‍රකාශ කර සිටින්නේ, 2022.03.18 වන දින තමා 3 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 63577 ජේ.ආර්.ගාමිණී නිලධාරියා සමග අදාල සිදුවීම සිදුවූ ස්ථානය වෙත ගියද, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනිමට කිසිදු සම්බන්ධයක් නොමැති බවයි.

6 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් රියදුරු 75552 ඩී.සී.බුද්ධික චන්දන ප්‍රකාශ කර සිටින්නේ, තමා රියදුරු ලෙස ස්ථානාධිපතිවරයා සමග මෙදින කටයුතු කළ නමුත්, මෙම අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ නොවූ බවයි.

4 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 66505 ප්‍රසාද් නිලධාරියා මේ වන විට පොලිස් සේවයේ නොමැති බවත්, රාජකාරී වැඩ තහනමකට ලක්ව ඇති බවත් 2023.07.17 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී 2 වන වගඋත්තරතකරු වන උප පොලිස් පරීක්ෂක පී.ජී.සී.ජයතිස්ස නිලධාරියා විසින් දැනුම් දී ඇත.

7 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 68214 සම්පත් නිලධාරියා 2023.07.17 සහ 2024.08.09 යන දිනයන්හි කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයන් සඳහා කැඳවා තිබුණ ද, ඔහු සහභාගී වී නොමැති අතර, නොපැමිණීම සම්බන්ධයෙන් කිසිදු දැනුම්දීමක් ද සිදු කර නොමැත.

<u>නිරීක්ෂණ සහ නිගමනය</u>

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, ඔහු තම ව්‍යාපාරික ස්ථානයේ සිටියදී කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව වගඋත්තරකරුවන් තම ව්‍යාපාරික ස්ථානය වෙත පැමිණ තමාව අත්අඩංගුවට ගෙන පහරදී තම අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවයි.

එහෙත් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරුට එරෙහිව තම පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් අනුව අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූලව සිදුකරන ලද බවත්, පැමිණිලිකරුට කිසිදු ආකාරයේ පහරදීමක් හෝ වධහිංසාවක් සිදුනොකළ බවත් ය.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත යොමු කොට ඇති පොලිස් ස්ථානයේ උධෘත ප්‍රකාරව හබරණ පොලිස් ස්ථානයේ හදිසි දුරකථන ඇමතුම් ලේඛනයේ 2022.03.18 වන දින පැය 18.43ට පිටුව 69 ඡේදය 174 යටතේ යොදා ඇති සටහන අනුව හබරණ දඹුල්ල පාරේ වයින් ස්ටෝර්ස් අසල පුද්ගලයෙක් අශෝභන ලෙස හැසිරෙන බවට තොරතුරක් ලැබී ඇති බවටත්, මෙම තොරතුර ලැබී ඇත්තේ, 119-118 දුරකථන පැමිණිලි අංශයෙන් වන බටවත් කරුණු නිරීක්ෂණය වේ.

මෙම දුරකථන ඇමතුම මගින් ලද පැමිණිල්ල අනුව ස්ථානාධිපතිගේ නියෝග අනුව 4 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 66505 ප්‍රසාද් හා 7 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් 68214 සම්පත් යන පොලිස් නිලධාරීන් පැමිණිල්ල පිළිබඳව සොයා බැලීම සඳහා එදිනම එනම 2022.03.18 දින වේලාව 18.30 ස්ථානයෙන් පිටව ගොස් ඇති බව හබරණ පොලිස් ස්ථානයේ සුළු වැරදි ලේඛනයේ 2022.03.18 වන දින පැය 18.50ට පිටුව 07 ඡේදය 291 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි.

මෙදිනම 1 වන වගඋත්තරකරු වන හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාද වේලාව පැය 13.50ට හබරණ පොලිස් ස්ථානයේ සුළු වැරදි ලේඛනයේ පිටුව 06 ඡේදය 290හි සටහන් යොදා නියෝජ්‍ය පොලිස්පති මෙහෙයුම් රාජකාරී සඳහා පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ. 1 වන වගඋත්තරකරු වන හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා 2022.03.18 දින පැය 19.30 පොලිස් ස්ථානයට නැවත පැමිණ ඇති අතර, හබරණ පොලිස් ස්ථානයේ සුළු වැරදි ලේඛනයේ පිටුව 07 ඡේදය 292හි ඔහුගේ පැමිණීමේ සටහන් යොදමින් තමා හිරිවඩුන්න ප්‍රදේශයේ සංචාරය කරමින් සිටියදී ලද තොරතුරක් අනුව 118-119 යන දුරකථන පැමිණිලි අංශයට ලද ඉහත සඳහන් කළ පැමිණිල්ලේ සඳහන් ස්ථානයට පිටව ගිය බවත්, එසේ යන විට හබරණ නගරයේ පොල අසල චේතන යන අයගේ කඩ කාමරය ඉදිරිපිට පොලිස් සැරයන් 66505 ප්‍රසාද් හා පොලිස් කොස්තාපල් 68214 සම්පත් යන දෙදෙනා, බීමත්ව අශෝභන ලෙස හැසිරෙමින් සිටි පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු මෙම නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පාමින් සිටි බැවින් එම වරද කියාදී 119 පැමිණිල්ලේ නම් සඳහන් බීමත් ලෙස අශෝභන ලෙස හැසිරුණු චේතන යන අයව 2022.03.18 දින පැය 19.20ට අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇති බව පෙනි යයි.

තමා විසින් මෙම පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේදී තමාටද බලහත්කාරය පෑම සිදුකල බැවින් එම ස්ථානයේ සිටි පොලිස් සැරයන් 63577 ගාමිණී හා පොලිස් කොස්තාපල් 95535 කපිල යන පොලිස් නිලධාරීන්ද සහය කර ගත් බවටත්, අත්අඩංගුවට ගත් මෙම පැමිණිලිකරු අවම බලයක් යොදා ගනිමින් ජීප් රථයෙන් පොලීසියට රැගෙන එන ලද බවටත්, මෙම පුද්ගලයා පොලීසිය වෙත රැගෙන එන අවස්ථාවේදී අසභ්‍ය ලෙස පොලිස් නිලධාරීන්ට බැන වදිමින් කලහකාරී ලෙස හැසිරුණු බවටත් 1වන වගඋත්තරකරු වන ස්ථානාධිපතිවරයා විසින් එකී සටහනෙහි දක්වා ඇත.

එසේම, 2022.03.18 වන දින පැය 19.35ට හබරණ පොලිස් ස්ථානයේ සුළු වැරදි ලේඛනයේ පිටුව 09 ඡේදය 293හි යොදා ඇති සටහන අනුව මෙම පැමිණිලිකරුව 3 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 63577 ගාමිණී හා පොලිස් කොස්තාපල් 95536 සමන්ත යන නිලධාරීන් විසින් හබරණ රෝහල වෙත රැගෙන ගොස් ඇති බවටත්, ඔහුව අංක 31/2022 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය සමගින් වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බවටත් කරුණු නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු වන හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක එන්.එන්.ජයලත් හා මෙම පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමට සහය වී ඇති අනෙකුත් වගඋත්තරකාර පොලිස් නිලධාරීන් සියළු දෙනාගේ පිටවීමේ හා පැමිණීමේ සටහන් නිරීක්ෂණය කිරීමේදී හබරණ පොලිස් ස්ථානයේ හදිසි ඇමතුම් දුරකථන ලේඛණය 118-119 අනුව 2022.03.18 වන දින පැය 18.43ට දඹුල්ල පාරේ වයින් ස්ටෝර්ස් එක අසල චේතන නැමති අයෙකු බීමත්ව මාර්ගයේ අශෝභන ලෙස හැසිරෙන බවට පැමිණිල්ලක් ලැබී ඇති බවටත්, එම පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පොලිස් සැරයන් 66505 හා පොලිස් කොස්තාපල් 68214 යන නිලධාරීන් ස්ථානයෙන් පිටව ගෙස් ඇති බවටත්, මෙකී නිලධාරීන්ට අදාල තැනැත්තා සාපරාධි බලහත්කාරය පෑම හේතුකොට ගෙන ස්ථානාධිපතිවරයා අදාල ස්ථානය වෙත පැමිණ ඇති බවටත්, එසේ පැමිණ ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකාර තේජන සම්පත් යන අයව අත්අඩංගුවට ගෙන ඇති බවටත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුට එරෙහිව ලද පැමිණිල්ලට අදාළව සාක්ෂි කිහිපයක් සටහන් කොටගෙන ඇති අතර, එම සාක්ෂි සටහන් කර ඇත්තේ 2022.03.19 දින එනම්, පැමිණිලිකරු අත්අඩංගුවට ගත් දිනට පසුදිනයේ දී බව පෙනී යයි.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ, ඔහු තම කඩය තුළ සිටියදී වන බවත්, වගඋත්තරකරුවන් ඔහුගේ වෙළඳසැලේ දොර බලහත්කාරයෙන් ඇරගෙන ඇතුළු වී ඔහුට පහර කිහිපයක් ගසා ඔහුගේ බිරඳගේ ද විරෝධය මැද බිම දිගේ ඇදගෙන ගොස් ජීප් රථයට දමා පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ ඉහත කී පැමිණිල්ලේ සඳහන් කරුණු සනාථ කිරීම සඳහා ඔහුගේ බිරිඳ වන රාජපක්ෂ ආරච්චිලාගේ ඉනෝකා සංජීවනී රාජපක්ෂ යන අය විසින් 2023.02.28 වන දිනැති දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර සිටින්නේ, තම ස්වාමි පුරුෂයා පැමිණිලිකරු වන තේජන සම්පත් සමරසිංහ වන බවත්, ඔහු විදුලි කාර්මිකයෙකු බවත්, 2022.03.18 වන දින රාත්‍රි 6.30ත් 7.00ත් අතර කාලයේ තම ව්‍යාපාරික ස්ථානයේ ප්‍රධාන දොර අඩවල් කොට වසා ඔහුගේ විදුලි කාර්මික වැඩක නිරතව සිටියදී හබරණ පොලීසියේ පොලිස් සැරයන් 66505 ප්‍රසාද් යන නිලධාරියා පැමිණ "උඹ පරිස්සම් වෙලා හිටපන්", යනුවෙන් පවසා පිටව ගිය බවත්, ඊට පැය භාගයකට පමණ පසුව මෝටර් රථයක් පැමිණ තම ව්‍යාපාරික ස්ථානය අසල නැවැත් වූ බවත්, හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වන ජයලත් පැමිණ තම ව්‍යාපාරික ස්ථානයේ දොර විවෘත කර "මේකාට ගහලා ඇදලා දාගනින්", යනුවෙන් ප්‍රකාශ කළ බවත්, එවිට අනෙක් නිලධාරීන් තම ස්වාමි පුරුෂයාට අමානුෂික ලෙස පහරදී කැබ් රථයකට නංවා ගෙන ගිය බවත් ය.

එසේම, දොඩම්තැන්නේ ගෙදර ප්‍රියන්ත රුවන් ජයතිලක යන අය විසින් 2023.02.28 වන දිනැති දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා "ශ්‍යාමලී හෝටලය" නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත්, එකී ව්‍යාපාරික ස්ථානය ඉදිරිපිට පැමිණිලිකරු වන තේජන සමරසිංහ යන

අය විසින් "අරුණ ඉලෙක්ට්‍රිකල්ස්" නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත්, 2022.03.18 වන දින රාත්‍රී 7.30ට පමණ පොලිස් ජීප් රථයක් පැමිණ "අරුණ ඉලෙක්ට්‍රිකල්ස්" නම් ව්‍යාපාරික ස්ථානය ඉදිරිපිට නවත්වනු ඇසුණු බවත්, ඒ පිළිබඳව ඔහුගේ වැඩි අවධානයක් නොතිබුණු බවත් ය. පසුව "අරුණ ඉලෙක්ට්‍රිකල්ස්" නම් ව්‍යාපාරික ස්ථානයේ අඩවල් කර වසා තිබුණු ප්‍රධාන දොර විශාල ශබ්දයකින් විවෘත කළ බව ඇසුණු බවත්, "මේකාට ගහලා ඇදලා දාගනින්", යැයි හබරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වන ජයලත් මහතා පවසනු ඇසුණු බවත්, ඒ සමඟම පැමිණි අනෙක් පොලිස් නිලධාරීන් පැමිණිලිකරු වන තේජන සමරසිංහ යන අය ප්‍රධාන මාර්ගයට ඇද දමා ඔහුට අතින් හා පයින් අමානුෂික ලෙස පහර දී පොලිස් කැබ් රථයට නංවාගෙන පිටත්ව ගිය බව දුටු බවත් ඔහු විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළින් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කරුණු සහ ඔහුගේ බිරිඳගේ සහ දොඩම්තැන්නේ ගෙදර ප්‍රියන්ත රුවන් ජයතිලක යන අයගේ දිවුරුම් ප්‍රකාශයන්හි සඳහන් කරුණු සමාන බවකින් යුක්ත බව නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් ද පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී එම සිද්ධිය ඇසින් දුටු පුද්ගලයින් තිදෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර එකී ප්‍රකාශ හබරණ පොලිස් ස්ථානයේ සුළු වැරදි ලේඛනයේ 2022.03.19 වන දින පැය 09.30ට පිටුව 19 සහ ඡේදය 301 යටතේ ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව රේරියාගේ නිලූකා ප්‍රියදර්ශනී ජයරත්න යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ ඇය පැමිණිලිකරුගේ කඩය අසල එළවළු මැස්සක වෙළඳාම් කරන බවත්, 2022.03.18 වන දින සවස 06.00ත් 07.00ත් අතර වේලාවේ පැමිණිලිකරු බීමත්ව පැමිණ ඔහුගේ නිවස ඉදිරිපිට මාර්ගයට පැමිණ පොලිස් ස්ථානාධිපතිවරයා හට අසභ්‍ය වචනයෙන් බැණ වැදුණු බවත්, එම අවස්ථාවේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙක් පැමිණ බිව්වානම් අන් අයට කරදර නොකර නිවසට වී සිටින ලෙසට පැවසූ බවත්, ඉන්පසු පැමිණිලිකරු විසින් පොල්ලක් රැගෙන පොලිස් නිලධාරීන් දෙදෙනා හට පහර දීමට උත්සහ කළ බවත් ය. එසේම, ඉන් විනාඩි 5කට හෝ 10කට පසුව පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු පොලිස් නිලධාරීන් කණ්ඩායම් දෙකක් ජීප් රථයකින් සහ කැබ් රථයකින් පැමිණ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සූදානම් වූ අවස්ථාවේදී ඔහු බිම පෙරළී පොලිස් නිලධාරීන් හට බැණ වැදුණු බවත්, පසුව ඔහුව ඔසවා කැබ් රථයට දමා පොලිස් නිලධාරීන් විසින් රැගෙන ගිය බවත්, පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදු නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

එසේම, පේලිතන්ත්‍රිගේ තුෂාර සුබා මංජුල යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ ඔහු හබරණ නගරයේ අරක්කු බාර් එක අසල බයිට් කඩයක් කරගෙන යන බවත්, පැමිණිලිකරුව හඳුනන බවත්, පැමිණිලිකරු නිතරම ඔහුගේ කඩය ඉදිරිපිටට පැමිණ පොලිස් නිලධාරීන්හට බැණ වදින බවත්, පොලිස් නිලධාරීන් පැමිණෙන විට පැමිණිලිකරු නිවස තුළට ගොස් දොර වසාගන්නා බවත්, ඔහු දින කිහිපයක්ම එසේ සිදු කළ බවත්, 2022.03.18 වන දින සවස 06.51ට පමණ පැමිණිලිකරු බීමත්ව

ඔහුගේ නිවස ඉදිරිපිට මාර්ගයට පැමිණ පොලිස් ස්ථානාධිපතිවරයා හට අසභ්‍ය වචනයෙන් බැණ වැදුණු බවත්, එම අවස්ථාවේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙක් පැමිණ බිව්වානම් අන් අයට කරදර නොකර නිවසට වී සිටින ලෙසට පැවසූ බවත්, පැමිණිලිකරු විසින් එම පොලිස් නිලධාරීන් දෙදෙනා හට ද බැණ වැදුණු බවත්, පසුව පොලිස් ජීප් රථයක් සහ කැබ් රථයක් පැමිණ පැමිණිලිකරු කලහකාරී ලෙස හැසිරීම නිසා මහත් පරිශ්‍රමයක් දරා පොර බදාගෙන පැමිණිලිකරු අල්ලාගෙන රැගෙන ගිය බවත්, පැමිණිලිකරුගේ හැසිරීම හබරණ නගරයේ සිටින සියලු දෙනාහට මහත් කරදරයක් බවත් ය.

එමෙන්ම, වේලිපන්හිටිගේ කපිල ප්‍රියදර්ශන යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු හබරණ නගරයේ සතිපොළ ඉදිරිපිට රටබීම හලක් කරගෙන යන බවත්, පැමිණිලිකරුගෙන් ඔවුන්හට කරදර වන බවත්, පැමිණිලිකරු බීමත්ව පාරට ඇවිත් පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරීන් හට අසභ්‍ය වචනයෙන් බැණ වදින බවත්, 2022.03.18 වන දින ද එලෙසම හැසිරුණු බවත්, එදින රාත්‍රී 7.40ට පමණ පොලිස් ජීප් රථයක් සහ කැබ් රථයක් පැමිණි බවත්, පැමිණිලිකරු පොලිස් නිලධාරීන් සමඟ පොර බදිමින් කලහකාරී ලෙස හැසිරීම නිසා මෙල්ල කරගෙන කැබ් රථයට දමාගෙන රැගෙන ගිය බවත්, පැමිණිලිකරු හට පොලිස් නිලධාරීන් විසින් කිසිදු අවස්ථාවක පහර නොදුන් බවත් ය.

ඉහත කී රේරියාගේ නිලූකා ප්‍රියදර්ශනී ජයරත්න, පේලිතන්ත්‍රිගේ තුෂාර සුබා මංජුල සහ වේලිපන්හිටිගේ කපිල ප්‍රියදර්ශන යන අයගේ ප්‍රකාශයන් අනුව සලකා බැලීමේ දී පැමිණිලිකරු බීමත්ව කෑගසමින් හැසිරී ඇති බව, ඔවුන් තිදෙනා විසින්ම ප්‍රකාශ කර ඇති බව පෙනී යයි. එසේම, පැමිණිලිකරු සම්බන්ධයෙන් ලැබී ඇති අංක 31/2022 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය අනුව ඔහු මත්පැන් බී මත්වී ඇති බවට දොස්තරයා විසින් සටහන් කොට තිබීම අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී ඔහු බීමත්ව සිට ඇති බවට තහවුරු වේ. එසේහෙයින් වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති පරිදි ඔවුන් වෙත හදිසි ඇමතුම් දුරකථන ලේඛණය 118-119 අනුව පැමිණිලිකරු බීමත්ව මාර්ගයේ අශෝභන ලෙස හැසිරෙන බවට පැමිණිල්ලක් ලැබීම හේතුවෙන් එම ස්ථානයට ගොස් පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවට වන ප්‍රකාශය බැහැර කිරීමට නොහැකි බව ද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගනු ලැබූ දිනට පසු දින එනම්, 2022.03.19 වන දින අංක බී 392/22 යටතේ කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, ඔහුට එරෙහිව චෝදනාව වී ඇත්තේ, තම යුතුකම ඉෂ්ට කිරීම වැළැක්වීම සඳහා රජයේ සේවකයින් වන පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පෑම සිදුකිරීම වේ. එමෙන්ම 1979 අක 41 දරණ බීමත්ව කරන ලද වැරදි සම්බන්ධ විධිවිධාන පනතේ 12(2) වගන්තිය ප්‍රකාරව ද චෝදනා ගොනු කොට ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුට වගඋත්තරකරුවන් විසින් පහරදුන් බව පැමිණිල්ල මගින් දන්වා සිටියි. මෙලෙස ඔහුට පහරදීම සිදුකොට ඇත්තේ, 4 වන වගඋත්තරකරු වන

පොලිස් සැරයන් ප්‍රසාද් 66505 හා 7 වන වගඋත්තරකරු වන පොලිස් කොස්තාපල් සම්පත් 68214 යන නිලධාරීන් දෙදෙනා විසින් වන බවත්, ස්ථානාධිපති ජයලත් විසින් ලබාදුන් අණ අනුව මෙම පොලිස් නිලධාරීන් දෙදෙනා තමාට පහරදුන් බවත් පැමිණිල්ලේ සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ 2022.03.19 වන දින නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරු එදින එනම්, 2022.03.19 වන දින අධිකරණය වෙත රැගෙන ගොස් ඇති අතර, ඔහුව ශරීර ඇප මත මෙදින මුදා හැරීමෙන් පසුව ප්‍රතිකාර ලබා ගැනීම සඳහා දඹුල්ල රෝහලට ඇතුළත්ව ඇති බව නිරීක්ෂණය වේ.

එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය යටතේ පැමිණිලිකරු හට 2022.03.18 වන දින රාත්‍රී 7.30ට පමණ තමා දන්නා හඳුනන පොලිස් නිලධාරීන් තිදෙනෙකු වන පොලිස් ස්ථානාධිපති ජයලත්, ප්‍රසාද් සහ සුජිත් යන නිලධාරීන් සහ ඔහු විසින් නම නොදන්නා නිලධාරියෙකු විසින් තමාගේ හිසට, පපුවට සහ පාද වලට අතින් සහ පයින් පහරදුන් බවත්, පහරදීමෙන් පසුව ඔහුව බිම දිගේ ඇදගෙන ගිය බවත් සඳහන් කර ඇත.

තවද, එකී අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ ශරීරයේ පවතින තුවාල පහත පරිදි දක්වා තිබේ.

01. Abrasion 3cm x 2cm on the back of the head (occipital region) in midline.

02. Abrasion 4cm x 2cm upper 1/3 of the back left to midline.

03. Abrasion 1cm x 1cm on back of the left elbow joint.

මෙකී තුවාල බරපතල නොවන තුවාල බව ද එකී අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ දක්වා තිබේ. එසේම, ඔහුගේ පපු ප්‍රදේශය එක්ස්රේ පරීක්ෂණයකට ලක් කර ඇති අතර ඒ තුළින් අස්ථි බිඳීමක් අනාවරණය නොවන බව ද අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ දක්වා ඇත.

තවද, මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම අංක 31/2022 යටතේ හබරණ රෝහලේ වෛද්‍යවරයා වෙත 2022.03.18 වන දින පැය 19.35ට රැගෙන ගොස් ඇති අතර, එම පෝරමයේ අංක 13 යටතේ සීරීම් තුවාල ඇති බවටත්, අංක 15 යටතේ පීඩාවේ ප්‍රභේදය බරපතල නොවන බවටත්, අංක 16 යටතේ ප්‍රාශ්වාසයේ මධ්‍යසාර ගඳ ඇති බවටත්, මත්වී ඇති බවටත්, සළකුනු කොට ඇති බව නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව සිදු කරනු ලබන පහරදීමේ චෝදනාව වගඋත්තරකරුවන් ප්‍රතික්ෂේප කරමින් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරු බීමත්ව අශෝභන ලෙස හැසිරෙන බවට 119-118 දුරකථනයන්ට ලද පැමිණිල්ල අනුව ඔහුව අත්අඩංගුවට ගැනීමට ගිය අවස්ථාවේදී පැමිණිලිකරු පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පාන ලද බවත්, ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් නිලධාරීන්ට නොහැකි වූ බැවින් හබරණ පොලීසියේ ස්ථානාධිපතිවරයාටද අදාල ස්ථානය වෙත යාමට සිදුවූ බවත්, මෙම පැමිණිලිකරුගේ හැසිරීම හේතු

කොට ගෙන තවත් පොලිස් නිලධාරීන් එම ස්ථානය වෙත කැඳවූ බවත්, මෙම බීමත් පැමිණිලිකරු පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරයපාමින් සිටියදී අවම බලය යොදා අත්අඩංගුවට ගත් බවත් ය. මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමේදී ඔහු බිම වැතිරී නිලධාරීන් සමග බිම වැටී ඔවුන් සමග ඔට්ටු වන්නට වූ බවත්, මෙම පැමිණිලිකරු අධික ලෙස මත්පැන් පානය කර සිටි බැවින් ආයාසයක් දරා පොලිස් කැබ් රථයට නංවා ගැනීමට සිදු වූ බවත් ය.

පැමිණිලිකරු විසින් ඔහුට පහරදුන් බව සනාථ කිරීම සඳහා ඔහුගේ ඔහුගේ බිරිඳගේ දොඩම්තැන්නේ ගෙදර ප්‍රියන්ත රුවන් ජයතිලක යන අයගේ දිවුරුම් ප්‍රකාශයන් කොමිෂන් සභාව වෙත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කොට ඇති අතර, එකී දිවුරුම් ප්‍රකාශයන් මගින් දන්වා සිටින්නේ, පැමිණිලිකරුට අතින් හා පයින් අමානුෂික ලෙස පහරදී පොලිස් කැබ් රථයට නංවාගෙන ගිය බවයි.

පැමිණිලිකරු සම්බන්ධයෙන් ලැබී ඇති අංක 31/2022 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය අනුව ඔහු මත්පැන් බී මත්වී ඇති බවට දොස්තරයා විසින් සටහන් කොට තිබීම අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී ඔහු බීමත්ව සිට ඇති අයෙකු වන බවට කරුණු නිරීක්ෂණය වන බැවින් ඔහුව අත්අඩංගුවට ගැනීමේදී ඔහු නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පාන ලද බවටත්, වගඋත්තරකරුවන් සමග ඔට්ටු වී බිම වැටී නිලධාරීන් සමග පොර බැදී බවටත්, එහිදී කිසියම් හෝ තුවාල ඇති වන්නට ඇති බවටත්, වගඋත්තරකරුවන් විසින් කරනු ලබන ප්‍රකාශය බැහැර කිරීමට නොහැකි ය. එසේම, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පැමිණිලිකරු එලෙස පොලිස් නිලධාරීන් සමග පොර බදිමින් කලහකාරී ලෙස හැසිරුණු බව ඉහත කී පේරියාගේ නිලූකා ප්‍රියදර්ශනී ජයරත්න, පේලිතන්ත්‍රිගේ තුෂාර සුබා මංජුල සහ වේලිපන්හිටිගේ කපිල ප්‍රියදර්ශන යන තිදෙනා විසින් ද වගඋත්තරකාර පාර්ශවය වෙත ප්‍රකාශ ලබා දීමේ දී සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ ශරීරයේ පවතින තුවාල වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවක් හේතුවෙන් සිදුවූ තුවාල බවට නිශ්චිතවම නිගමනය කිරීමේ හැකියාවක් නොපවතී. එබැවින් පැමිණිල්ල මගින් දක්වා ඇති පරිදි වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු හට පහරදීමක් සිදු කර ඇති බව තහවුරු නොවේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුව අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා ඔහුව හබරණ පොලිස් ස්ථානයේ සිට හබරණ හන්දිය වෙත මාංචු දමා පාගමනින් රැගෙන විත් එම ස්ථානයේ තිබූ ජීප් රථයකට නංවා ගනු ලැබූ බවත්, එම අවස්ථාවේදී නගරයේ සිටි මහජනතාව තමා දෙස බලා සිටින ලද බවත්, මෙම ක්‍රියාව හේතුවෙන් තමා අපහාසයට පත් වූ බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුව 2022.03.19 වන දින පැය 10.10ට කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන යාමට කටයුතු කර ඇති අතර, ඔහුව අධිකරණය වෙත රැගෙන ගොස් ඇත්තේ, 2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ජයතිස්ස හා 5 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 7335 සුනිල් යන නිලධාරීන් ය. 2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ජයතිස්ස නිලධාරියා විසින් හබරණ පොලිස් ස්ථානයේ දෛනික තොරතුරු සටහන් පොතේ 2022.03.19 දින 68 පිටුවේ 3542 ඡේදයේ

සඳහන් කර ඇති ආකාරයට පැමිණිලිකරුව අධිකරණය වෙත රැගෙන ගොස් ඇත්තේ, අංක ඩබ්.පී.එල්.ඊ 9097 දරණ කැබ් රථයෙනි.

2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරික්ෂක ජයතිස්ස යන අය ප්‍රකාශ කර සිටින්නේ, ඔහු ගල්ඔය පොලිස් මුරපොලේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කරමින් සිටියදී මෙදින තමාව හබරණ පොලිස් ස්ථානය වෙත කැඳවන ලද බවත්, මෙම පැමිණිලිකරුව අධිකරණය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙසට තමාට උපදෙස් ලද බවත්, මෙදින මෙම පැමිණිලිකරු අධිකරණය වෙත රැගෙන යාම සඳහා වාහනයක් තිබේදැයි විමසා බලන ලද බවත්, වාහනයක් පොලිස් ස්ථානය තුල නොමැති බව දැන්වූ බවත් ය. පොලිස් ස්ථානය සතු කැබ් රථයේ ටයර්වල දෝෂයක් හේතුවෙන් එය පරික්ෂා කිරීම සඳහා ආයතනයකට ගෙන ගොස් ඇති බව දැනගත් බැවින් රියදුරු සමග දුරකථනයෙන් සම්බන්ධවී වාහනය කැඳවීමට කටයුතු කළ බවත්, වාහනය නැවත පොලීසිය වෙත රැගෙන එන වේලාව නිශ්චිතව ප්‍රකාශ කල නොහැකි බව රියදුරු දන්වා සිටි බවත් 2 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

මෙම පැමිණිලිකරු නියමිත වේලාව තුළ එනම්, පැය 24ක කාල සීමාව ඉක්මවා යාමට පෙර කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන යායුතු වුවත්, පොලිස් ස්ථානයෙන් ඔහුට වාහනයක් ලබානොදුන් නිසාවෙන් වාහන නොමැති අවස්ථාවල සැකකරුවන් පොදු ප්‍රවාහන සේවයේ රැගෙන යන බැවින් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරිම සඳහා පොලිස් ස්ථානයෙන් පිටතට පැමිණිලිකරු හා තවත් සැකකරුවෙකු සමග පැමිණි බවත්, පොලිස් ස්ථානය ඉදිරිපිට වනසංරක්ෂණ කාර්යාලය ළඟදී පොලිස් ස්ථානයේ කැබ් රථය දඹුල්ල පාරේ සිට පැමිණෙනවා දුටු බවත්, එවිට වාහනය නවත්වා පැමිණිලිකරු එම ස්ථානය වෙත රැගෙන ගොස් වාහනයට නංවා ගෙන අධිකරණය වෙත රැගෙන ගිය බවත්, මෙම පැමිණිලිකරුට අත්මාංචු දමා රැගෙන ගිය නමුත්, තමා විසින් මෙම පැමිණිලිකරුට අවමානයක් සිදුවන ආකාරයෙන් කිසිදු ක්‍රියාවක නොයෙදුනු බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුව අධිකරණය වෙත රැගෙන ගිය 2වන වගඋත්තරකරු වන උප පොලිස් පරික්ෂක ජයතිස්ස ගල්ඔය පොලිස් මුරපොලේ ස්ථානාධිපතිවරයා වේ. ඔහුව 2022.02.19 දින හබරණ පොලිස් ස්ථානය වෙත කැඳවා ඇත්තේ, 1 වන වගඋත්තරකරු වන ස්ථානාධිපති එස්.එන්.ජයලත් විසිනි. ඔහුව කැඳවීමට හේතුව වී ඇත්තේ, මෙම පැමිණිලිකරුව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ කටයුත්ත සඳහා වේ. ඒ අනුව මෙම පැමිණිලිකරුව 2022.02.19 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා වන කටයුතු හබරණ පොලීසියේ ස්ථානාධිපතිවරයාගේ නියෝගය පරිදි සිදුවූ බව නිරික්ෂණය වේ. උප පොලිස් පරික්ෂක ජයතිස්සට පැවරී ඇත්තේ, මෙම පැමිණිලිකරු අධිකරණය වෙත රැගෙන යාමය. එසේ නම් හබරණ පොලීසියේ ස්ථානාධිපති විසින් පැමිණිලිකරුව අධිකරණය වෙත රැගෙන යාම සඳහා අවශ්‍ය වාහන පහසුකම් උප පොලිස් පරික්ෂක ජයතිස්ස වෙත සපයා දිය යුතුයි. එහෙත් ස්ථානාධිපති ජයලත් විසින් පැමිණිලිකරුව අධිකරණය වෙත රැගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රවාහන

පහසුකම් සලසා දී නොමැති බව නිරීක්ෂණය වේ. හබරණ පොලිස් ස්ථානය සතු කැබ් රථයේ ටයර්වල දෝෂ සහිත තත්වයක් පැවති බැවින් එය සපයා ගැනීම සඳහා වාහනය අදාල ආයතනයකට යොමු කළ බව එහි රියදුරු විසින් උප පොලිස් පරීක්ෂක ජයතිස්සට දන්වා තිබේ. වාහනය පැමිණිය හැකි වේලාව කිව නොහැකි බව ද දන්වා තිබේ. මෙහිදී සලකා බැලිය යුතු වැදගත්ම කරුණ වන්නේ, පැමිණිලිකරු 2022.03.19 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කළයුතු බව ස්ථානාධිපති නොදැන සිටියේද යන්න ය.

පැමිණිලිකරුගේ ප්‍රකාශය අනුව ඔහුව පොලිස් ස්ථානයෙන් එළියට ගෙන හබරණ හන්දියේ නවතා තිබූ කැබ් රථය වෙතට පා ගමනින් රැගෙනවිත් ඔහුව වාහනයට නංවා ගෙන ඇත. මෙහිදී පෙනී යන්නේ වාහනය පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමට අවස්ථාව තිබියදී පැමිණිලිකරු පොලිස් ස්ථානයෙන් එළියට ගෙන පාර දිගේ රැගෙන එන තෙක් වාහනය නවතා ගෙන සිට ඇති බවයි. 2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ජයතිස්සගේ ඉහත ප්‍රකාශය අනුව ඔහු ඒ පිළිබඳව දැනුවත්ව සිට නැත. 2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ජයතිස්ස හට පැමිණිලිකරු අධිකරණය වෙත රැගෙන යාම සඳහා පොලිස් ස්ථානයෙන් වාහනයක් නොලද බැවින් පැය 24 ඉක්මවා යාමට පෙර අධිකරණය වෙත රැගෙන යාමට කටයුතු කර ඇති අතර, ඔහු මෙම පැමිණිලිකරුව පොදු ප්‍රවාහන සේවයෙන් හෝ අධිකරණය වෙත රැගෙන ගොස් ඔහුගේ රාජකාරිය ඉටුකිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් ඔහුව පොලිසියේ සිට පාර දිගේ අත්මාංචු දමා පයින් රැගෙන ගිය බවට සාක්ෂිද ඉදිරිපත් කොට ඇත. වලල හේරත් මුදියන්සේලාගේ අලුත්ගම ගෙදර කීර්ති චන්දන කුමාර දිසානායක යන අය විසින් 2023.02.28 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ ඔහු සමඟ පැමිණිලිකරු වන තේජන සමරසිංහ යන අයව 2022.03.19 වන දිබ පෙ.ව. 10ට කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන ගිය බවත්, පැමිණිලිකරුව පමණක් මාංචු දමා රැගෙන ගිය බවත්, පොලිස් ස්ථානයේ සිට හබරණ ඉන්ධන පිරවුම් හල දක්වා මාර්ගයේ දකුණු පසින් රැගෙන විත්, ඉන්ධන පිරවුම් හල ඉදිරිපිටින් මාර්ගයේ වම්පසට ගෙන නගර මධ්‍යයේ පිහිටි සියපුර හාඩ්වෙයාර් නම් ව්‍යාපාරික ස්ථානය ඉදිරිපිටින් රැගෙන ගොස් හබරණ රෙස්ට් හවුස් ආයතනය ඉදිරිපිට බස් නැවතුම්පොළ ඉදිරිපිට නවතා තිබූ පොලිස් කැබ් රථයට නංවා ගන්නා අයුරු තමා දුටු බවයි.

එසේම, ඕවිටිගල විතානගේ සුනිමල් ප්‍රියශාන්ත සහ විල්ප්‍රඩ්ලාගේ ලයනල් සරත්චන්ද්‍ර යන දෙදෙනා විසින් 2023.02.28 දිනැති දිවුරුම් ප්‍රකාශයන් දෙකක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් පැමිණිලිකරු වන තේජන සමරසිංහ යන අය හඳුනන බවත්, 2022.03.19 වන දින පෙ.ව. 10ට පමණ ඔවුන් හබරණ පොලිස් ස්ථානය ආසන්නයේ ඇති ලොතරැයි කවුන්ටරය වෙත පැමිණ ටිකට්පත් පරීක්ෂා කරමින් සිටියදී පැමිණිලිකරු වන තේජන සමරසිංහ යන අයව මාංචු දමා හබරණ පොලිස් ස්ථානයේ සිට පොලිස් නිලධාරීන් විසින් ඔහුගේ ඇඳුමේ කොළරයෙන් ඇදගෙන පාරට රැගෙන ආ

බවත්, හබරණ අනුරාධපුර පාරේ බස් නැවතුම්පල අසල නවතා තිබු පොලිස් කැබ් රථයට පැමිණිලිකරු නංවාගෙන රැගෙන යන අයුරු දුටු බවත් ය.

ඉහත දක්වන ලද පැමිණිලිකරුගේ හා වගඋත්තරකරුවන්ගේ සියළු කරුණු, ප්‍රකාශ, උධෘත හා සාක්ෂි සළකා බැලීමේදී 2022.03.19 වන දින පැමිණිලිකරුව අධිකරණය වෙත රැගෙන යාම සඳහා හබරණ පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙනවිත් අත්මාංචු දමා පාර දිගේ රැගෙන ගොස් පොලිස් කැබ් රථයට නංවාගෙන ඇති බව නිරීක්ෂණය වේ. එලෙස මාංචු දමා මහජනතාව වෙත නිරාවරණය වන අයුරින් පාර දිගේ රැගෙන යාම තුළින් පැමිණිලිකරු අවමන් සහගත සැලකීමකට ලක්ව ඇති බව පෙනී යයි. එසේ හෙයින් පැමිණිලිකරු ඒ ආකාරයෙන් අධිකරණය වෙත රැගෙන යාමට කටයුතු කරන ලද 2 වන සහ 5 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් කිසිම තැනැත්තෙක් වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකල යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන් විෂයෙහි වෘත්තීමය වගකීමක් පවතින බැවින් 2 වන සහ 5 වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකරු අධීක්ෂණ වගකීමෙන් බැඳෙන බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

01. 1 වන , 2 වන සහ 5 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රුපියල් දෙදහස (රු.2,000/-)ක මුදලක් බැගින් රුපියල් හයදහස (රු.6,000/-)ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ලබා දිය යුතු ය.

02. 1 වන , 2 වන සහ 5 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 03 . 27 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට

දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්-: 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය ,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.